# රන්ජිතම් ගුණරත්නම් සහ
## අපේ කාලයේ ශිෂ්‍ය දේශපාලනය

පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ අළුතින් ඉදි කළ නේවාසිකාගාර ගොඩනැගිල්ල හිටපු උප කුලපතිවරයෙකු වන අයිවෝ ජෙනින්ග්ස් අනුස්මරණය පිණිස නම් කර එය උත්සවශ්‍රීයෙන් විවෘත කිරීමට පෙර එහි කඩා වැදුනු, ජනතා විමුක්ති පෙරමුණ ට සම්බන්ධ හෝ ඔවුන් විසින් මෙහෙයවනු ලැබුවා වූ සිසුන් පිරිසක් විසින් සමරු ඵලකය ගලවා විනාශ කර එම ශාලාව රන්ජිතම් ගුණරත්නම් නමින් නම් කරන්නට උත්සාහයක යෙදුනු බව පසුගිය ද අසන්නට ලැබුනි. මීට පෙර තනවන ලද ශාලාවක් සිසුන් විසින් මොහොමඩ් නිස්මි නමින් නම් කර ඇති බව ද මෙහිදී කියවුනි.

දශක ගණනාවක පෙර විසූ ශ්‍රීමත් අයිවෝ ජෙනිසුන් ගැන තබා සංගීතවේදී අයිවෝ ඩෙනිසුන් ගැන පවා අද පරපුර නොදන්නවා විය හැක. එලෙසම, අසූවේ දශකයේ මුල් භාගයේ පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ ඉංජිනේරු පිඨයේ සිසුවෙක් වූ රන්ජිතම් ගුණරත්නම් සහ අසූවේ දශකයේ අග භාගයේ සිසුවෙකු වූ මොහොමඩ් නිස්මි ගැන ද වත්මන් සිසුන් තුල ඇත්තේ අල්ප දැනුමක් විය හැක. ඔවුන් දෙදෙනා ම මරා දමා දැනට වසර ද හතක් පමණ ගෙවී ගොස් ඇත.

මේ ලිපියේ අරමුණ පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ මගේ සමකාලීන ඉංජිනේරු උපාධි අපේක්ෂකයෙකු වූ රන්ජිතම් ගුණරත්නම් සහ අපේ කාලයේ ශිෂ්‍ය දේශපාලනය ගැන මගේ මතකයේ හොඳින් රැඳී ඇති කරුණු ස්වල්පයක් ඒ පිළිබඳ උනන්දුවක් දක්වන අයගේ ප්‍රයෝජනය පිණිස ඉදිරිපත් කිරීමයි.

රන්ජිතම් ගුණරත්නම් 1981 දී පේරාදෙණිය විශ්ව විද්‍යාලයට ඇතුළු වුනේ කෑගල්ල ප්‍රදේශයෙනි. ඔහු දෙමල පියෙකුට දාව, සිංහල මවකගේ කුසෙන් උපන් නියම ශ්‍රී ලාංකිකයෙක් විය. ඔහු ඉගෙන ගෙන තිබුනේ සිංහල මාධ්‍යයෙනි. මා ඔහු දැන සිටි මුළු කාලයේ දී ම රන්ජිතම් එකදු දෙමල වචනයක් හෝ කතා කරනු මා අසා නැත. මා හොඳින් දන්නා පරිදි 1985 දී අන්තර් විශ්ව විද්‍යාල ශිෂ්‍ය බල මණ්ඩලයේ රැස්වීම් වල දී ඔහු අත්සන් කළේ, රංජිත් ගුණරත්න කියා ය. පසු කලෙක පක්ෂය තුල ඔහු හැඳින්වුනේ මහේෂ් යන නමිනි. එසේ නමුදු ඔහු සිය අර්ධ දෙමල කම ප්‍රතික්ෂේප කළ බවක් හෝ ඒ ගැන පශ්චාත්තාප වුනු බවක් මම නොසිතමි.

රන්ජිතම් ගේ බාල සොහොයුරා වූ ප්‍රේමකුමාර් ගුණරත්නම් ද පසු කලෙක පේරාදෙණියේ ඉංජිනේරු උපාධි අපේක්ෂකයෙක් විය. මා එතරම් හොඳින් නොහඳුනන ඔහුව මා අවසාන වරට දුටුවේ 1986 දෙසැම්බර් මස දී ය. ඔහු එවෙලේ සිටියේ ජවිපෙ ශිෂ්‍ය නායකයෙකු වූ වෛද්‍ය පීඨයේ ජයශ්‍රී සමග නිසා සිය වැඩිමහල් සොහොයුරු රන්ජිතම් මෙන්ම ප්‍රේමකුමාර් ද ජවිපෙ හා සම්බන්ධවී වැඩ කරන්නේ යැයි මම සිතුවෙමි.

රන්ජිතම් සොයුරා මා මුලින් ම හඳුනා ගන්නා ගත්තේ දෙවන වසරේ සිසුවෙක් ලෙසින් ඔහු නවක සිසුන් වූ අප කිහිප දෙනෙක් සමග කතා බහක යෙදුනු මොහොතක දී ය. අපේ මාතෘකාව වූයේ විශ්ව විද්‍යාලයේ මහා ශිෂ්‍ය සභාව සඳහා ඉංජිනේරු පිඨ පළමු වසර ශිෂ්‍ය නියෝජිතයන් තෝරා ගැනීමයි.

කලා, විද්‍යා පීඨ වල මෙන් නොව, අපේ පීඨයේ නියෝජිත කණ්ඩායම තේරී පත්වුනේ පොදු සිසු ස්වාධීන කණ්ඩායමක් ලෙස නිතරඟයෙනි. කරුණු එලෙස වුවද, ඒ කණ්ඩායමේ ජනතා විමුක්ති පෙරමුණ ට සම්බන්ධ සිසුන් කිහිප දෙනෙක් සිටි බව නො රහසකි. රන්ජිතම් මින් එක් අයෙක් විය. මීට දිගු කලකට පසුව සංස්ථා සභාපතිවරයෙකු ලෙස කෙටි කාලීන දේශපාලන පත්වීමක් ලැබුවෙකු ද මේ අතර වූ බව මගේ මතකයයි.

මේ කාලය වන විට සමසමාජ, කොමියුනිස්ට් ආදී පැරණි වාමාංශික දේශපාලන පක්ෂ වල ට සම්බන්ධ ශිෂ්‍ය සංගම් පේරාදෙණිය සරසවියෙන් සහමුලින් ම නැතිවී ගොස් තිබුණි. පෞද්ගලික මට්ටමෙන් වාසු-බාහු ගේ නව සමසමාජ පක්ෂය ට සම්බන්ධ කම් තිබුනු සිසුන් දෙතුන් දෙනෙක් කලා පීඨය තුල සිටියහ.

මහා ශිෂ්‍ය සභාවේ බලය හිමි කරගෙන සිටියේ ජ.වි.පෙ. ට සම්බන්ධ සමාජවාදී ශිෂ්‍ය පෙරමුණ විය. මේ සඳහා ඔවුන් ට ඉංජිනේරු පීඨ ස්වාධීන කණ්ඩායම ඇතුළු තවත් පීඨ කණ්ඩායම් වල ආධාරය ලැබුනි. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ට සම්බන්ධ නිදහස් ශිෂ්‍ය සංගමය ට කලා පීඨය තුල සුළු බලයක් හිමි වී තිබුනු අතර, ජ.වි.පෙ. ට එරෙහි ප්‍රධානතම බලවේගය වූයේ එක්සත් ජාතික පක්ෂය ට අනුබද්ධ සමවාදී ශිෂ්‍ය සංගමය යි. සමවාදී ශිෂ්‍ය සංගමය සාමාජිකත්වයෙන් අඩු කුඩා පිරිසක් වූව ද, එවකට පැවති එ.ජා.ප. රජයේ අනුග්‍රහයෙන්, ඔවුන් ගේ බල පරාක්‍රමය කැපී පෙනුණි.

ගාමිණී දිසානායක ඇමතිවරයා අනුශාසක ධූරය දැරූ සමවාදී ශිෂ්‍ය සංගමයේ ක්‍රියාකාරිකයෙක් වීම, උපාධිය ලැබූ පසු ඉක්මනින් ම රජයේ රැකියාවක් ලබා ගැනීම සහතික කරන්නක් විය. ශිෂ්‍ය නේවාසිකාගාර වල සියළුම පූර්ණ කාලීන උපශාලාධිපතිවරු සමවාදී ශිෂ්‍ය සංගමයේ හිටපු නායකයෝ වූහ. මේ එ.ජා.ප. බලය කලා පිඨය තුල ප්‍රධාන වශයෙන් කේන්ද්‍ර ගත වී තිබුනි. මින් අදහස් කෙරෙන්නේ අනෙකුත් පීඨ වල සිටි එ.ජා.ප. හිතවතුන් බොහෝ විට නිහඬව සිටි බවයි. සමවාදී ශිෂ්‍ය සංගමයේ සමහර රැස්වීම් වලට ඇමති දිසානායක ද සහභාගී වන බව, එම රැස්වීමක සිටි ජ.වි.පෙ. නියෝජිතයෙක් එවෙලේ ම ලියූ වාර්තාවක් පසු කලෙක කියවා මම දැනගත්තෙමි. සමවාදී ශිෂ්‍ය සංගමය බොහෝ විට ක්‍රියා කළේ රාජ්‍ය බලයෙන් තම සංගමය පවත්වාගෙන යෑම පිණිස මිස, වෙනත් මාර්ග වලින් තම සාමාජිකත්වය වැඩි දියුණු කර ගැනීම පිණිස නොවේ.

විශ්ව විද්‍යාලය පුරාම පොදුවේ සමවාදී ශිෂ්‍ය සංගමය ට අනුබද්ධ සිසුන් හැඳින්වූයේ ජුන්ටන් යන නමිනි. මෙය නම්බඒ යන වදනේ සිංහල අනුවර්තනයයි. අපේ පිඨයේ ම ජ.වි.පෙ. ක්‍රියාකාරී ජ්‍යෙෂ්ඨ ශිෂ්‍යයෙකු වූ ආනන්ද ඉඩමේගම වරෙක පැවසූ පරිදි ජුන්ටන් දෙවර්ගයක් විය. ඒ -ලා ජුන්ටන්" සහ -තද ජුන්ටන්" වශයෙනි. තද ජුන්ටෝ වනාහී දැඩිව එ.ජා.ප. දේශපාලනයේ යෙදෙන්නෝ ය. ලා ජුන්ටෝ නම් ඔවුන් ගේ අනුගාමිකයෝ ය. පසු කලෙක (1982 දෙසැම්බර්) ඇතිවූ සරසවි සටනක දී ජවිපෙ අනුගාමිකයින් විසින් ප්‍රධාන වශයෙන් ම පහර දුන්නේ මේ තද ජුන්ටන් ට ය. බොහෝ ලා ජුන්ටෝ බේරී ගියෝ ය.

මෙලෙසම විශ්ලේෂණයක් කළ හොත් ජ.වි.පෙ ට සම්බන්ධ පිරිස් වර්ග කළ හැක්කේ, ක්‍රියාකාරිකයින් (Cadres), අනුගාමිකයින් :තදකකදඇරි* සහ අනුග්‍රාහකයින් (Sympathisers) වශයෙනි.

ක්‍රියාකාරිකයින් සිටියේ කිහිප දෙනෙකි. ඔව්හු කෙලින් ම ජවිපෙට සම්බන්ධව වැඩ කළහ. විශ්ව විද්‍යාලය තුල ජවිපෙ පන්ති සංවිධානය කළෝ ය. නියමුවා සහ සීනුව පුවත්පත් විකුණූහ. රන්ජිතම්,

> *ඉහත වර්ග කිරීම තුල, මා ජවිපෙ ක්‍රියාකාරිරියන් යැයි හැඳින් වූ පිරිස තවත් දෙකොටසක ට බෙදිය හැකි ය. ඒ ''හොඳ ජේවීපී කාරයන්'' සහ ''නග් ජේවීපී කාරයන්'' වශයෙනි. පෙර සඳහන් කළ අයගෙන් රන්ජිතම් ගුණරත්නම් සහ ආනන්ද ඉඩමේගම මා දමන්නේ හොඳ ගොඩට ය. මොව්හු සිය පක්ෂ ප්‍රතිපත්ති මැද වුව ද යම්කිසි තර්කානුකූල විවාදයක සඳහා ඉඩකඩ තිබූ ඇත්තෝ වූහ. පසු කලෙක බලවත් වූ දෙවන පිරිස මෙන් සිය විරුද්ධවාදීන් අවි හෝ මැර බලයෙන් නිහඬ කරන්නට ඔව්හු නොසිතූහ.*

ඉඩමේගම ආදීහු මෙවැනි ක්‍රියාකරුකයන් වූහ.

අනුගාමිකයින් පිරිස මීට වැඩි විය. ඔව්හු ජවිපෙ දේශපාලන පන්ති සියල්ලම සමත් වී සිටි අතර ශිෂ්‍ය ව්‍යාපාරයේ මෙන්ම මැයි දින පෙළපාලිය වැනි බාහිර දේශපාලන කටයුතු වලට ද උනන්දුවෙන් සහභාගී වූහ. -රූං පෙත්ත කැරකෙනවා, පාන් පෙත්ත උඩ යනවා, රොනී ද මෙල් සුරංගනා කතා කියනවා" යයි ගායනා කරමින් ජවිපෙ අනුගාමිකයන් වූ මගේ මිතුරන් පිරිසක් 1982 ජවිපෙ මැයි දින පෙළපාලියේ රංගනයක යෙදුනු අපූරු විලාශය මා නගර සභා පිටිය අසල පදික වේදිකාවක සිට නැරඹූ අයුරු මට සිහිවෙයි.

මේ අතර පළමුවන වසර සිසුන් ලෙසින් අධ්‍යාපන ධවල පත්‍රිකා සටන, උදගමක් විවෘත කිරීම සඳහා විශ්ව විද්‍යාලය මැදින් දිවෙන ගලහ පාර දිගේ මෝටර් රථයකින් ගමන් කළ අගමැති ප්‍රේමදාස ට -හූ" කියූ සිසුන් පස් දෙනා ගේ ශිෂ්‍යභාවය තහනමට එරෙහිව කළ සටන යනාදී මහා ශිෂ්‍ය සභා ක්‍රියාකාරකම් වලට උනන්දුවෙන් සහභාගී වුනු අපි වැඩි දෙනා ඒ අනුසාරයෙන් ශිෂ්‍ය සටන්කරුවෝ ලෙසට ද, එනිසාම ජවිපෙ අනුග්‍රාහකයින් බවට ද ක්‍රමක්‍රමයෙන් පත්වීමු. මේ අනුග්‍රාහකයින් යනුවෙන් මා අදහස් කරන්නේ පොදු ශිෂ්‍ය ව්‍යාපාරය තුල සමාජවාදී ශිෂ්‍ය සංගමය හරහා ජවිපෙ සපයන නායකත්වය සහ ඔවුන් ගේ ක්‍රියාකාරීත්වය පිළිබඳ මූලික ප්‍රශ්ණ නැති පිරිසයි. ඉංජිනේරු පීඨය තුල ක්‍රියාකාරී දේශපාලනයක් නැති වීම අප අතර මේ විශාල අනුගාමිකත්වය ට මූලික හේතුව විය.

ජවිපෙ පිළිබඳ මගේ ප්‍රසාදය තවත් වැඩි වීමට තවත් සිද්ධියක් වූයේ 1982 මුල් භාගයේ දිනක අපේ ඉංජිනේරු පීඨ උපාධිධාරියෙකු වූ එවකට ජවිපෙ මහ ලේකම් ලයනල් බෝපගේ විසින් -ජාතික ප්‍රශ්ණය" (National Question) මැයින් පැවැත්වූ දේශණයයි. ඔහු සිංහලෙන් කතා කළ අතර, එය එවෙලේ ම දෙමල භාෂාවට පරිවර්තනය කරන ලදී. මේ ප්‍රසාදය එතැන් පටන් 1984 වසරේ ජවිපෙ සිය ජාතික ප්‍රශ්ණය පිළිබඳ ස්ථාවරය විජේවීර ලියූ (මා සම්පූර්ණයෙන් කියවා නැති) -ජාතික ප්‍රශ්ණයට විසඳුම කුමක් ද?" යන කෘතිය ඔස්සේ ප්‍රකාශයට පත් කරන තුරුම ක්‍රම ක්‍රමයෙන් වැඩුනි.

උතුරේ සටන් පිළිබඳ පශ්චාත් 1983 ජවිපෙ ස්ථාවරය නිසා ජවිපෙ කෙරෙහි මගේ සිතේ තිබූ ප්‍රසාදය බිඳුන නමුත් 1984 ජූලි මාසයේ පේරාදෙණිය විශ්ව විද්‍යාල පොලිසියෙන් වෛද්‍ය පීඨ ශිෂ්‍ය පද්මසිරි අබේසේකර ඝාතනය කළ දින සිට, මා මුලින්ම විශ්ව විද්‍යාල ක්‍රියාකාරී කමිටුවේ (Action Committee) සාමාජිකයෙක් ලෙස ද, අනතුරුව අන්තර් විශ්ව විද්‍යාල ශිෂ්‍ය බල මංඩලයේ (Inter University Students' Federation) නියෝජිතයෙක් ලෙසද කටයුතු කරන අවස්ථාවන්හි දී, මා තවදුරටත් ජවිපෙ හිතවාදියෙකු නොවුන ද, ජවිපෙ විසින් එද ශිෂ්‍ය ව්‍යාපාරය තුල ඉටු කරමින් සිටි කාර්ය භාරය පිළිබඳව නම් මගේ කිසිදු ප්‍රශ්ණයක් නොවීය.

ඉහත සඳහන් කෙරුණු ජාතික ප්‍රශ්ණය පිළිබඳ ජවිපෙ පශ්චාත් 1983 ස්ථාවරය පිළිබඳව මා මුලින් ම දැනගත්තේ ද රන්ජිතම් ගුණරත්නම් ගෙනි. එතෙක් ජවිපෙ උතුරේ සටන ට පක්ෂ යැයි සිතා සිටි මා ඔහුගෙන් ඇසුවේ මේ නව ප්‍රතිපත්තිය රටට එළිදරව් නොකරන්නේ ඇයි ද කියායි. මේ වන විට ජවිපෙ තහනම් පක්ෂයක් විය. එසේ කළහොත් පොදුවේ උතුරේ සටනට විරුද්ධ රටේ මහජනතාවගෙන් මීට වඩා සහයෝගයක් ජවිපෙ ට ලැබෙනු ඇති බව මම කියා සිටියෙමි. එවිට රන්ජිතම් ප්‍රකාශ කළේ එය ඔවුන් ලඟදීම පටන් ගන්නා බවයි. එලෙස ම ඉන් දින කිහිපයකට පසු අක්බාර් ශාලාව ඉදිරිපිට ගම්පොල පාරේ තාර මත සුදු තීන්තෙන් ත්‍රස්තවාදීන් ට කප්පම් නොදෙනු, ජනතාවට අයිතීන් දෙනු යැයි ලොකු අකුරෙන් ලියා තිබෙනු දක්නට ලැබුනි. ජවිපෙ මේ සටන් පාඨය රට පුරා ගෙන ගියහ.

ජාතික ප්‍රශ්ණය පිළිබඳ ජවිපෙට එක එල්ලේ ම විරුද්ධ ස්ථාවරයක් දැරුවේ වාසු-බාහු නායකත්වයෙන් යුතු නව සමසමාජ පක්ෂය සහ සුචරිත ගම්ලත් මහනුවර අවට ප්‍රධාන වැඩ කොටසක් ඉටුකළ විප්ලවවාදී කොමියුනිස්ට් පක්ෂයයි.

මේ අසූවේ දශකයේ මැද භාගයයි. ජනවාර්ගික (Ethnic) ප්‍රශ්ණය යන යෙදුම ඒවන විට භාවිතයේ නොතිබුණි. මා කලක ලේකම් ධූරයක් ද දැරූ ඉංජිනේරු පීඨ සමාජ විද්‍යා සංගමය මගින් ජාතික ප්‍රශ්ණය යන මැයෙන් දේශණ මාලාවක් සංවිධානය කරන ලදී. මේ දේශණ පැවැත්වූවන් අතර, පෝල් කැස්පර්ස් පියතුමා, මහාචාර්ය සුචරිත ගම්ලත්, ආචාර්ය වික්‍රමබාහු කරුණාරත්න යනාදීන් විය. ජවිපෙ නියෝජිත නීතිඥයෙකුට ද ආරාධනාවක් කෙරුවද, පක්ෂය තහනම් කර තිබූ තත්වය යටතේ එය නොපැවැත්විනි.

ජ.වි.පෙ ට සම්බන්ධ කොටස් ක්‍රියාකාරිකයින්, අනුගාමිකයින් සහ අනුග්‍රාහකයින් වශයෙන් වර්ග කළ හැකි බව මම ඉහත පැවසුවෙමි. මෙකී අනුග්‍රාහකයින් කිසි ලෙසකින් ජවිපෙ හෝ සමාජවාදී ශිෂ්‍ය සංගමයේ සාමාජිකයින් නොවුන ද, පිටස්තරයින් ට එහි වැඩි වෙනසක් නොපෙනුනි.

අපේ තාත්තලා ගේ කාලයේ, යම් කිසි ප්‍රගතිශීලි අදහසක් දැරූ හැම අයෙකු ම -සමසමාජ කාරයෙක්" වූවා සේම, අපේ කාලයේ යමෙක් ශිෂ්‍ය ව්‍යාපාරයට යම් කිසි ආකාරකින් සහභාගී වූවා නම් ඔහු -ජේවිපී කාරයෙක්" ලෙස හඳුනා ගනු ලැබිනි.

ඉහත වර්ග කිරීම තුල, මා ජවිපෙ ක්‍රියාකාරිරියන් යැයි හැඳින් වූ පිරිස තවත් දෙකොටසක ට බෙදිය හැක. ඒ -හොඳ ජේවීපී කාරයන්" සහ -තග් ජේවීපී කාරයන්" වශයෙනි. පෙර සඳහන් කළ අයගෙන් රන්ජිතම් ගුණරත්නම් සහ ආනන්ද ඉඩමේගම මා දමන්නේ හොඳ ගොඩට ය. මොව්හු සිය පක්ෂ ප්‍රතිපත්ති මැද වූව ද යම්කිසි තර්කානුකූල විවාදයක සඳහා ඉඩකඩ තිබූ ඇත්තෝ වූහ. පසු කලෙක බලවත් වූ දෙවන පිරිස මෙන් සිය විරුද්ධවාදීන් අවි හෝ මැර බලයෙන් නිහඬ කරන්නට ඔව්හු නොසිතූහ. පසුව මා නොයෙකුත් ප්‍රකාශිත ලිපි ලේඛනාදියෙන් කියවූ පරිදි, සිය ජීවිතයේ අවසාන කාලයේ දී රන්ජිතම් සිට ඇත්තේ එවකට පැවති සටන්කාමී ප්‍රතිපත්ති පිළිබඳ ප්‍රසාදයකින් නොවේ.

ජවිපෙ සහ එජාප අනුබද්ධ ශිෂ්‍ය දෙකොටස අතර තිබූ ගැටුම් ක්‍රම ක්‍රමයෙන් වැඩිවී අවසානයේ 1982 දෙසැම්බරයේ දී පේරාදෙණිය මහා ශිෂ්‍ය සභාව ට නියෝජිතයින් තෝරා ගැනීම සඳහා මැතිවරණය පැවැත්වුනු දිනයේ මහා කෝලාහලයක් බවට පෙරලුනි. බලධරයන් විසින් වහා වසා දැමුනු විශ්ව විද්‍යාලය යළි 1983 ජනවාරියේ ඇරඹුනේ ශිෂ්‍ය ගැටුම ගැන සොයා බැලීමට පත් කළ උදලාගම කොමිසමේ වැඩ කටයුතු ද සමඟ ය. කොමිසන් සභා නිර්දේශය අනුව රන්ජිතම් ගුණරත්නම් සහ ආනන්ද ඉඩමේගම ඇතුළු සිසුන් හය දෙනෙකුගේ ශිෂ්‍ය භාවය වසරකට අහෝසි විය. මේ ගැන ඇරඹුනු ශිෂ්‍ය උද්ඝෝෂණ තවතවත් බරපතල කණගාටුදයක තත්වයන් ට විශ්ව විද්‍යාලය ඇද දැමූ අතර, රන්ජිතම් ට යළි කිසි දිනෙක හෝ ඉංජිනේරු පීඨ සිසුවෙකු ලෙස ඉගෙනීමේ කටයුතු කළේ යයි මම නොසිතමි.

කෙසේ නමුදු 1985 වසරේ දී එවකට අන්තර් විශ්ව විද්‍යාල ශිෂ්‍ය බල මණ්ඩලයේ කැඳවුම්කරු ලෙස කටයුතු කළ, පසුව ජවිපෙ දේශපාලන මණ්ඩල සභිකයෙක් වූ, උපාලි ජයවීර පොලිස් අත් අඩංගුවට පත්වීමත් සමගම ඒ වගකීම බාරවූයේ රන්ජිතම් ගුණරත්නම්ට ය. රන්ජිතම් මූලාසනය දැරූ රැස්වීමක දී, එවකට කොළඹ විශ්ව විද්‍යාලයේ ජනප්‍රිය ව පැවති ස්වාධීන ශිෂ්‍ය සංගමයේ නායකයා වූ දයා පතිරණ ව අන්තර් විශ්ව විද්‍යාල ශිෂ්‍ය බල මණ්ඩලයෙන් පන්නා දැමූ අයුරු මට සිහිවේ. දයා පතිරණ තව දුරටත් කොළඹ විශ්ව විද්‍යාලයේ ලියාපදිංචි ශිෂ්‍යයෙක් නොවේ යැයි කොළඹ සරසවියේ ජවිපෙ සහ පොදු ශිෂ්‍ය කමිටුව කළ උද්ඝෝෂණය එයට හේතුව විය. ඊට වසර එකහමාරක ට පමණ පසු, 1986 දෙසැම්බරයේ දී දයා පතිරණ මරා දමන ලදී. එය දිගු දේශපාලන මිනී මැරීම් රාශියක ආරම්භය විය. මේ වෙනම ම ලිපියකින් විස්තර කළ යුතු මාතෘකාවකි.

කෙසේ හෝ අවසානයේ, 1989 අග දී දේශප්‍රේමී ජනතා ව්‍යාපාරය විසින් මෙහෙයවන ලද සටන් නිමාවට පත්වුනේ තවත් දහස් ගනන් නන්නාදුනන සටන්කරුවන් ගේ ද මා හිතවත් රන්ජිතම් ගුණරත්නම් ගේ ද ජීවිත අකාලයේ නිම කරවමිනි. ඔහු එවකට පක්ෂයේ මධ්‍යම කාරක සභිකයෙක් ලෙස කටයුතු කළා යැයි 1990 දී The Island පත්‍රයේ පලවූ චන්ද්‍රප්‍රේම ගේ ලිපියක මා කියවූයෙමි. එම ලිපියේම සඳහන් වූ පරිදි දිස්ත්‍රික්ක ලේකම් වරයෙකු වූ රන්ජිතම් ගේ සොහොයුරු ප්‍රේමකුමාර් ගුණරත්නම් ද මරා දමන්නට ඇතැයි සැලකුණ ද, ඔහු ජීවතුන් අතර ය. ජවිපෙ තිරය පිටුපස නායකයෙකු ලෙස මෑතක් වනතුරු ක්‍රියා කළ ප්‍රේමකුමාර්, අභ්‍යන්තර අර්බුදයක් හේතුවෙන් රටින් පිටවී ඇති බව පසුගිය ද පුවත්පත් හි පලවිය.

රන්ජිතම් ගුණරත්නම් කෙදිනක හෝ අවි දැරුවේ දැයි මම නොදනිමි. ඔහු මිය ගියේ අවියෙන් දැයි ද මම නොදනිමි. ඔහු අවි නොදැරූවෙක් යැයි ද එනිසාම ඔහු අවියෙන් මිය ගියේ නැතැයි ද කියා විශ්වාස කරන්නට මම කැමැත්තෙමි. නමුත් ඔහු මරා දැමූ බව සත්‍යයක් වේ. මෙලොව කිසිවෙකුට එවන් මරණයක් මතු අත් නොවේවා යයි මම පතමි.

රසන්ත චන්ද්‍රසූරිය
<ra.chandra.suriya@gmail.com>